## පාරිසරික කළමනාකරණය සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිතීන්

### SLS ISO 14001:2004

පාරිසරික කළමනාකරණ පද්ධති සඳහා වන පිරිවිතර භාවිතය සඳහා මාර්ගෝපදේශයකි.

### SLS ISO 14004:2004

පාරිසරික කළමනාකරණ පද්ධති සඳහා වන මූලධර්ම, පද්ධති සහ උපකාරී ශිල්ප ක්‍රම සඳහා මාර්ගෝපදේශයකි.

### SLS ISO 19011:2002

තත්ත්ව සහ/හෝ පාරිසරික කළමනාකරණ පද්ධති විගණනය සඳහා මාර්ගෝපදේශයකි.

## පාරිසරික කළමනාකරණය සඳහාවන ISO ප්‍රමිතීන්

- පාරිසරික ක්‍රියාකාරිත්වය තක්සේරු කිරීම **ISO 14031:1999**
- ජීවන චක්‍ර ඇගයීම් **ISO 14040:2006**
- ජීවන චක්‍ර බලපෑම් ඇගයීම **ISO/TR 14047:2003**

## ISO 14001 පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රියාදාමය

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් අයදුම්පත්‍රය සහ ලේඛණ ලබාගැනීම.
- නිසි අයුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සහ පාරිසරික කළමනාකරණ පද්ධති සංග්‍රහය භාර දීම.
- ඇගයීම කිරීම සහ සවිස්තරාත්මක වාර්තාව භාරදීම.
- නුසුදුසුතාවයන් නිවැරදි කර පාරිසරික කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම.
- පලමු විගණනය සහ විගණන වාර්තාව ලබාදීම.
- පලමු විගණනයට අදාල නුසුදුසුතාවයන් නිවැරදි කිරීම.
- අවසාන (දෙවන) විගණනය සහ විගණන වාර්තාව ලබාදීම.
- අවසාන විගණනයට අදාල නුසුදුසුතාවයන් නිවැරදි කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් බව තහවුරු කිරීම.
- සහතික පත්‍ර ලබා දීම.
- පසු පිරිස්සුම් විගණන පැවැත්වීම.

# පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණ ක්‍රියාවලිය



SLSI ISO 14001 Certified

MGMT. SYS. RvA C 155

SLAB ACCREDITED ISO/IEC: 17021 EMS-001-01


විමසීම්
වී ජී ජී ධර්මවර්දන
අධ්‍යක්ෂ - පද්ධති සහතිකකරණ අංශය
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
නො. 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත,
කොළඹ 8. දුරකථන : 011-2671567-72
දුරකථන/ෆැක්ස් : 011-2672613 ඊමේල් : dsc@slsi.slt.lk


පද්ධති සහතිකකරණ අංශය
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

## හැඳින්වීම

ISO 14001 යනු කුමක්ද? කුමන ප්‍රමිති මත එය පදනම් ව ඇත් ද?

ISO 14000 ප්‍රමිති කාණ්ඩය යනු අන්තර්ජාතික ප්‍රමිති ආයතනය මගින් ප්‍රකාශයට පත්කරන ලද පරිසර කළමනාකරණය, විගණනය, ක්‍රියාකාරිත්ව ඇගයීම සහ ජීවන චක්‍ර ඇගයීම ආදී ක්ෂේත්‍ර පාරිසරික නීති රෙගුලාසි සඳහා අනුකූල වීම තහවුරු කෙරෙන ස්වේච්ඡා ප්‍රමිති ගොනුවකි.

ISO 14004 ප්‍රමිතිය - මූලධර්ම, පද්ධති සහ තාක්ෂණික ක්‍රම සඳහා මාර්ගෝපදේශ සපයනු ලබයි.

**මෙම මාර්ගෝපදේශය කොටස් දෙකකින් යුක්තය.**

- පාරිසරික කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම.
- පාරිසරික විගණනයන් සිදුකිරීම.

මෙතුලින් පාරිසරික කළමනාකරණ පද්ධතිය කෙරෙහි බලපවත්වනු ලබන පොදු මූලධර්ම ස්ථාපනය කෙරෙන අතර අදාලවන පාරිසරික වැඩසටහන් සඳහා වන විශේෂිත මාර්ගෝපදේශ වලින් සමන්විත වේ.

- ISO 14001 - පාරිසරික කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා වන මූලික අවශ්‍යතා වලින් යුතු වේ.
- ISO 19011 - පාරිසරික සහ තත්ත්ව විගණන සඳහා මාර්ගෝපදේශයක් සපයනු ලබයි.
- ISO 14031 - පාරිසරික ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා වන නිර්ණායක සපයනු ලබයි.
- පාරිසරික ලේබල්කරණය සඳහා වන ප්‍රමිති ISO 14020, ISO 14021, ISO 14024
- ජීවන චක්‍ර ඇගයීම සඳහා වන ප්‍රමිති ISO 14040
- ජීවන චක්‍ර බලපෑම් ඇගයීම සඳහා වන ප්‍රමිති ISO/TR 14047
- ISO 14000 ප්‍රමිති කාණ්ඩය, ආයතනික ද්‍රව්‍ය බැහැර කිරීම්/විමෝචනය කිරීම් සඳහා සීමා හෝ කාර්ය්‍ය සාධන නිර්ණායක ඉදිරිපත් නොකරන නමුත් පරිසර දූෂණය වැළැක්වීම සඳහා ආයතනික අරමුණු සහ ක්‍රියාමාර්ග පිළිබඳව සලකා බලනු ලබයි.

## ISO 14001 වැදගත්කම

අන්තර්ජාතික ප්‍රමිති ආයතනය එළිදක්වන ලද තත්ත්ව කළමනාකරණ පද්ධති සඳහා වන **ISO** 9001 වැනි ප්‍රමිතීන් මෙන්ම **ISO** 14001 යනු පාරිසරික කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය සඳහා වන ස්වේච්ඡා ප්‍රමිතියකි.

ජාත්‍යන්තර වෙළඳාමේදී නිෂ්පාදන සහ සේවා සමාගම් කෙරෙහි සෘජු හා වක්‍රාකාරයෙන් ඇතිවන වෙළඳපොල පීඩනයන් නිසා, එම සමාගම් **ISO** 14001 ප්‍රමිතිය සඳහා අනුගත වීමට නැඹුරු වී ඇත. මනා සැලසුම්කරණයෙන් යුතු පාරිසරික කළමනාකරණ පද්ධතියක් සහිත ආයතනික නිෂ්පාදන සහ සේවා සඳහා වන පාරිභෝගික ඉල්ලුම වර්ධනය වීම සෘජු වෙළඳපොල පීඩනයක් ලෙසින්ද සැපයුම්කරුවන් **ISO** 14001 සඳහා අනුගත වීම කෙරෙහි ගැනුම්කරුවන්ගේ ඉල්ලුම වක්‍රාකාර වෙළඳපොල පීඩනය ලෙසින්ද දැක්විය හැක.

## ISO 14001 සහතික ලබා ගැනීමෙන් අත්වන වාසි

පාරිභෝගික සහ වෙළඳ පොළ අවශ්‍යතා සපුරාලීමට හැකිවීම **ISO** 14001 ප්‍රමිතියට අනුගත වීමේ මූලික වාසි ලෙස පෙන්නුම් කලද ආයතනයේ මූල්‍යමය සහ කාර්යක්ෂමතා/ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍රවල වර්ධනය වීම ද කැපී පෙනෙන වාසිදායක අවස්ථා වේ.

## වෙළඳ වාසි

- පාරිභෝගිකයන්ගේ පාරිසරික අභිප්‍රායන් සඳහා වන ඉල්ලුම සපුරාලිය හැකිවීම.
- සමාජය සමග යහපත් සබඳතාවක් පවත්වා ගත හැකිවීම.
- ආයතනයේ ප්‍රතිරූපය සහ වෙළඳපොල නියෝජනය වර්ධනය වීම.
- සැපයුම්කරුවන් සහතිකකරණ නිර්ණායක සඳහා අනුකූල වීමට හැකි වීම.

## මූල්‍යමය වාසි

- ආයෝජකයන් තෘප්තිමත් වීම සහ ප්‍රාග්ධන පහසුකම් වැඩිදියුණුවීම.
- සහනදායි මිලකට ලැබිය හැකි රක්ෂණාවරණය.
- වගකීම් සීමා වීම.
- වියදම් පාලනය වීම.

## කාර්යක්ෂමතා සහ ක්‍රියාකාරිත්ව වාසි

නිරන්තර ක්‍රියාකාරිත්වය තුලින් ඕනෑම ආයතනයක් සඳහා අනුගත විය හැකි ස්වේච්ඡා අවශ්‍යතාවයන් ලෙස **ISO** 14001 ප්‍රමිතිය හැඳින්විය හැකිය.

**ISO** 14001 ප්‍රමිතිය මගින් පාරිසරික ක්‍රියාකාරිත්ව නිර්ණායක ස්ථාපනය කිරීමක් සිදුනොකරන නමුදු ආයතනික ක්‍රියාකාරිත්වය නිසා ජනිත වන පාරිසරික බලපෑම් අධ්‍යයනය කර ඒවා සඳහා වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ආයතනයේ පාරිසරික ප්‍රතිපත්තිය ඇතුලත් පාරිසරික කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සිදු වේ.

## පාරිසරික විගණනය/සහතිකකරණය

පාරිසරික විගණනය යනු ආයතනයක පාරිසරික කළමනාකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය සහ නිරන්තර අභිවෘද්ධියේ සාර්ථකත්වය ඇගයීමට ලක් කරනු ලබන විධිමත් ක්‍රමවේදයකි.

පාරිසරික විගණනය ආයතනය මගින් නිර්ණය කර ඇති අරමුණු මත පදනම් වන අතර විගණනයේ විෂය පරාසය ආයතනය සමග සාකච්ඡා කර විගණන නිලධාරීන් විසින් තීරණය කරනු ලබයි.

**ISO** 19011 ප්‍රමිතිය බාහිර සහ අභ්‍යන්තර විගණනයන් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශය ලෙසින් භාවිතයට ගනු ලබයි.